www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ අගමැති, ඔහුගේ නෙරපීම අවිරෝධීව පිලිගනියි

## Sri Lankan prime minister passively accepts his dismissal

**2004 පෙබරවාරි 28**
**සමන් ගුනදාස විසිනි**

ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග විසින් තම ආන්ඩුව ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස බලයෙන් පහ කරනු ලැබීමට එරෙහිව ශ්‍රී ලංකා අගමැති රනිල් වික්‍රමසිංහ අභියෝගයක් එල්ල කරතැයි යමෙක් විශ්වාස කලේ නම් පසුගිය ඉරිදා ඔහුගේ හැසිරීම, එම විශ්වාසය බිඳ දැමීමට ඉවහල් විය. කොලඹ නගර මධ්‍යයේ පැවති ඔහුගේ දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂයේ (එජාප) සම්මේලනය අමතමින් ඔහු ජනාධිපතිගේ ක්‍රියාවන් යම්තමින් විවේචනය කල අතර පක්ෂයට කල හැකි එකම දෙය නම් අප්‍රේල් 2 දිනට කැඳවා ඇති මැතිවරනයට සහභාගි වීම හැර වෙන කල හැකි යමක් නැතැයි අවධාරනය කලේ ය.

පාර්ලිමේන්තු බහුතරයක් සහිත පක්ෂයක් නෙරපා හැරීමට කුමාරතුංග ගත් තීරනය පෙර නොවූ විරූ එකකි. පාර්ලිමේන්තුව විසුරුවා හරින අතරවාරයේ දී ඇයගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයින් දෙදෙනෙකු කැබිනෙට්ටුවට පත් කල ඇය කැබිනට් නොවන ඇමතිවරුන් 39ක් ඉවත් කලා ය. ඇය මෙම ක්‍රියාමාර්ගයට එලඹුනේ දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය සමග කෙරෙන සාම සාකච්ඡා මගින් "ජාතික ආරක්ෂාව" තර්ජනයට ලක්වී ඇතැයි ප්‍රකාශ කරමින් පසුගිය නොවැම්බරයේ ප්‍රධාන අමාත්‍යාංශ තුනක් පවරා ගැනීමෙන් අනතුරුව එලඹි මාස ගනනක දේශපාලන සිරවීමකින් පසුව ය.

නිවාඩු නිකේතනයක සිටින අතරවාරයේ දී ආන්ඩුව නෙරපා හැරීම පිලිබඳව දැනගන්නට ලැබුනු විට "ඇය උමතුවෙන් විය යුතු යැ"යි වික්‍රමසිංහ කෑගැසූ බවට වාර්තා විය. එනමුදු දින 10ක් ගතවන තුරු ඔහු ප්‍රසිද්ධ ප්‍රකාශයක් නිකුත් නොකලේ ය. *සන්ඬේ ටයිම්ස්* දේශපාලන ලියුම්කරු ලිවූ අයුරු "වාර්තාකරුවන් කිහිප දෙනෙකුගේ බලකිරීම මත ඉඳහිට ප්‍රකාශ කිහිපයක් නිකුත් කල නමුත් ආන්ඩුව විසුරුවා හැරීමට එරෙහිව සමවාය අයුරකින් ප්‍රතික්‍රියා දැක්වීමට එජාපෙ තවමත් සමත් වී නැත."

පෙබරවාරි 17 දින පුද්ගලික රූපවාහිනී විකාශයන් ඔස්සේ පෙනී සිටිමින් හා අනතුරුව පෙබරවාරි 22 දින එජාප සම්මේලනයට සහභාගිවෙමින් වික්‍රමසිංහ අවසානයේදී තම නිශ්ශබ්දතාවය බිඳ දැම්මේ ය. 2001 දෙසැම්බරයේදී ඔහුගේ ආන්ඩුව බලය ගැනීමෙන් අනතුරුව කුමාරතුංග සමග "සහජීවනයෙන්" පාලනය කිරීමට දැරූ උත්සාහය අසාර්ථක වූ බවට ඔහු චෝදනා කලේ ය. නොවැම්බරයේදී කුමාරතුංග විසින් අමාත්‍යාංශ තුනක් පවරා ගන්නා විට ආන්ඩුවේ ඇමතිවරුන් දිනා ගැනීමට ඇය උත්සාහ කල බවත් එය සිදු නොවූ විට, ඇය පාර්ලිමේන්තුව විසිරුවා හැරි බව ඔහු ප්‍රකාශ කලේ ය.

"එය ප්‍රජාතන්ත්‍රවිරෝධී ක්‍රියාවක්", "2001 මැතිවරනයේදී ආන්ඩුව නවතම ජනවරමක් ලබා සිටි තතු තුල ඇයට ඒ සඳහා කිසිම ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් නොතිබිනි" යැයි අගමැති ප්‍රකාශ කලේ ය. එනමුදු නීතිමය වශයෙන් හෝ දේශපාලන උද්ඝෝෂනයක් දියත් කිරීම මගින් හෝ, ඔහුව ඉවත් කිරීමේ කුමාරතුංගගේ ක්‍රියාවන්ට එරෙහිව යම් හෝ අභියෝගයක් එල්ල නොකරන බව වික්‍රමසිංහගේ ප්‍රකාශයන්ගෙන් පැහැදිලි විය. ස්ථිරසාර ආන්ඩුවක් ගොඩනගා ගැනීමට එක්සත් පෙරමුනු සභාගයට යලිත් ජන වරමක් ලබා දෙන්නැයි ඔහු බෙලහීන ලෙස ඡන්දදායකයින්ගෙන් ඉල්ලා සිටියේ ය. අප්‍රේල් 2 මැතිවරනයෙන් එජාපෙ බහුතර ජයග්‍රහනයක් ලබා ගත්තත් කුමාරතුංග විසින් යලිත් වරක් ආන්ඩුව නෙරපා දැමීම වලක්වන්නේ කෙසේදැයි යමෙකුට මතුවන පැහැදිලි ප්‍රශ්නයට වික්‍රමසිංහ පිලිතුරු නොදුන්නේ ය. ඊනියා සාම ක්‍රියාවලියට එරෙහිව හා විමුක්ති කොටි සංවිධානය සමග කවර හෝ සම්මුතියකට විරුද්ධත්වය පාමින් ස්වෝත්තමවාදී උද්ඝෝෂනයක් දියත් කල ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සමග නිල සන්ධානයක් ඇය තහවුරු කර ගත්තා ය. එක්සත් ජාතික පෙරමුන යලි බලයට පැමිනුන හොත් හා විමුක්ති කොටි සංවිධානය සමග ඇනහිටි සාකච්ඡා යලි ඇරඹුවහොත් "පාවාදීම" පිලිබඳ එම චෝදනාවන්ට ද බලයෙන් පහ කිරීමේ තර්ජනයට ද එය නැවත මුහුන දෙනු ඇත.

සමහර මාධ්‍ය විශ්ලේෂකයින් යෝජනා කරන ආකාරයට වික්‍රමසිංහගේ බෙලහීන පිලිගැනීම පුද්ගලික අසමත් බව පිලිබඳ කරුනක් නොවේ. ඒ වෙනුවට එමගින් පිලිබිඹු වන්නේ සමාජ හා දේශපාලන ආතතීන් තීව්‍ර වන කොන්දේසි තුල පාර්ලිමේන්තු පාලනයේ පැරනි රූපයන් වියැකී ගොස් ඇති බවට පාලක කව පුරා පවතින පිලිගැනීම යි. කුමාරතුංගට එරෙහි ඕනෑම

උද්ඝෝෂනයක් ප්‍රධාන පක්ෂ දෙකට ම පාලනය කර ගත නොහැකි වන සමාජබලවේගයන් මුදා හරිතැයි වික්‍රමසිංහ බිය වෙයි.

වික්‍රමසිංහගේ ආස්ථානය පිලිබඳව ඔහුට ආවඩන්නා වූ මාධ්‍ය ප්‍රකාශයන් තුල මෙම උත්සුකතාවන් පිලිබිඹු විය. "අගමැතිගේ නිදසුන පිලිපදිනු" යන උද්ධෘතය සහිත *ඩේලි මිරර්* පත්‍රයේ කතුවැකියකින් "ඔහුගේ විරුද්ධවාදීන්ට උග්‍ර ලෙස පහර දීමෙන්" වැලකී සිටීම සහ "ඔහුගේ ශිෂ්ඨසම්පන්න දේශපාලන ක්‍රියාමාර්ගය" පිලිබඳව අගමැතිවරයා පසසනු ලැබිනි. "රටට එහි දේශපාලනඥයින්ගේ පරිනත බව හා විශාරද දේශපාලන ඥානය දැවෙන අවශ්‍යතාවන් බවට පත්ව තිබේ. තේරුමක් නැති දේශපාලනික ගිගිරුම් හා උන්මාදයන්ගෙන් ජනතාවට ගැලවිය හැක්කේ එවිට පමනෙකි" යි පුවත්පත කියා සිටියේ ය.

කුමාරතුංගට හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වඩා වැඩියෙන් එජාපය ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට කැප වී නො සිටියි. කුමාරතුංග විසින් පාවිච්චි කරනු ලබන අත්තනෝමතික බලතල 1978 හි ව්‍යවස්ථාවට අඩංගු කරනු ලැබුවේ ජේ.ආර්. ජයවර්ධන විසින් නායකත්වය දෙනු ලැබූ එජාප ආන්ඩුවක් විසිනි. එමෙන්ම එය ශ්‍රීලනිප හා ජවිපෙ තරමටම සිංහල ස්වෝත්තමවාදයෙහි ගිලී පවතියි. එහි ප්‍රතිඵලයක් ලෙස මහා ව්‍යාපාරිකයන්ගේ හා ප්‍රධාන බලයයන්ගේ නියෝගයන්ට අනුකූලව විමුක්ති කොටි සංවිධානය සමග සාම සාකච්ඡා පැවැත්වුව ද "ජාතිය පාවාදීම" නමැති චෝදනාවට එය අතිශයින්ම සංවේදී ය.

"ප්‍රකෘතිමත් කරගනු ලැබුනු රට" "ගොඩනැගීමට අත ගසනවාත් සමග ම" ආන්ඩුව නිල බලයෙන් පහ කල බව එජාප සමුලුව වෙත වික්‍රමසිංහ පාරට්ටු කලේ ය. යලි පත් කර ගනු ලැබුවහොත් සය වසරක් තුල දී "නව ශ්‍රී ලංකාවක්" ගොඩ නගන බව ඔහු ප්‍රකාශ කලේ ය. "2004 දී පුද්ගලික අංශය තුල පමනක් නොව රාජ්‍ය අංශය තුල ද අපි නව රැකියා නිර්මානය කරන්නෙමු. ගොවීන්ට. අධ්‍යාපනයට උදව් කිරීමට අපට අවශ්‍ය යැ"යි ඔහු පැවසී ය. අති බහුතරයක් ජනතාව යලි යුද්ධයකට යාමට වුවමනා නැතිබව දන්නා වික්‍රමසිංහ එක්සත් ජාතික පෙරමුන "සාමයේ පක්ෂය" ලෙස පින්තාරු කරයි. කෙසේ වුවද, ගැටුම අවුලුවා ලූ 1983 දෙමල විරෝධී වධබන්ධනයන්ට පාර කැපීම පිලිබඳව පමනක් නොව දශකයකට අධික කාලයක් තිස්සේ යුද්ධය පවත්වා ගෙන යාම පිලිබඳව ද එජාපය ඍජුවම වග කිව යුතු බව මතක් කර ගත යුතු ය. සාමය, ජීවන කොන්දේසි වර්ධනය කිරීම, හා එජාප ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා පිලිවෙත් අවසානයකට ගෙන ඒම පිලිබඳව පොරොන්දු ඉදිරිපත් කරමින් කුමාරතුංගට 1994 මැතිවරනයේදී බලය දිනා ගත හැකි විය. මෙම කිසිම පොරොන්දුවක් ඉටු කෙරුනේ නැත.

එසේම, ඊනියා සාම ක්‍රියාවලිය, ජාමුඅ හා ලෝක බැංකුව විසින් නිර්දේශ කරනු ලබන ආර්ථික ප්‍රතිව්‍යුහකරනයේ නියෝගයන් සමග සමීපව බැඳී පවතියි. දශක දෙකක යුද්ධයකින් අනතුරුව මහා ව්‍යාපාරයන්ට හා ලෝක බලවතුන්ට සාමය අවශ්‍ය වී ඇත්තේ දිවයින, භූගෝලීය ප්‍රාග්ධනය සඳහා වූ ලාභ ශ්‍රම වේදිකාවක් බවට පත් කර ගැනීමටයි. කුමාරතුංග නායකත්වය දුන්, පෙරාතුව පැවති පොදුපෙරමුනු ආන්ඩුව සමයේ කරගෙන ගිය වෙලඳපල ප්‍රතිසංස්කරන, එක්සත් ජාතික පෙරමුන යටතේ ද ඉදිරියට යාම නිසා පෝසතුන් හා දුප්පතුන් අතර සමාජ පරතරය ගැඹුරු වීමට තුඩු දුන්නේ ය.

රාජ්‍ය අංශය පුද්ගලීකරනය කරමින් හා කප්පාදු කරමින් දස දහස් සංඛ්‍යාත රැකියා විනාශ කිරීම එක්සත් ජාතික පෙරමුනු ආන්ඩුව දිගටම ක්‍රියාත්මක කලේ ය. මහජන සෞඛ්‍යය හා අධ්‍යාපනය සඳහා වූ වියදම් කැපූ අතර දුප්පත් ගොවීන්ට දරුනු ලෙස පහර වදින අයුරින් පොහොර සහනාධාර අහෝසි කෙරුනි. සමාජයේ ආන්තික දරිද්‍රතාවයෙන් පෙලෙන කොටස් පවා අහස උසට නගින උද්ධමනයෙන් බැට කන අතර තුර ආන්ඩුව පොහොසතුන්ට බදු සහන හා විශේෂ සමාවන් ලබා දුන්නේ ය. රාජ්‍ය සෞඛ්‍ය අංශයේ හා දුම්රිය සේවයේ කම්කරුවන්ගේ වර්ජන පරාජය කිරීමේ ප්‍රයත්නයක් ලෙස එක්සත් ජාතික පෙරමුන, පොලිසිය හා හමුදාව බලමුලු ගැන්වී ය.

ප්‍රධාන පක්ෂ දෙක විසින් ම පවත්වා ගෙන යනු ලැබූ මෙම ක්‍රියාමාර්ගයන් මගින් ශ්‍රී ලංකාව තුල සමාජ හා දේශපාලන කාල බෝම්බයක් නිෂ්පාදනය කර ඇත. සාමාන්‍ය වැඩකරන ජනතාවගේ මූලික අවශ්‍යතා හා බලාපොරොත්තු ඉටු කිරීම කුමාරතුංගට හෝ වික්‍රමසිංහට කල නො හැකි ය. පක්ෂ දෙක කෙරෙහි පුලුල්ව පැතිර පවතින වෛරය, වාර්ගික වෛරය ඇවිස්සීම හා යුද්ධය කරා ආපසු යාමේ වාතාවරනයක් ඇති කිරීම සඳහා ජවිපෙ ජනතාවාදී වාචාලයන් විසින් ගසා කනු ලැබ ඇත.

අර්බුදයේ මෙම කොන්දේසි තුල, වික්‍රමසිංහ හා එක්සත් ජාතික පෙරමුන ද ඇතුලු සමස්ථ දේශපාලන සංස්ථාපිතයෙහිම පිටුබලය සහිතව කුමාරතුංග පාර්ලිමේන්තුවාදී නොවන පාලන විධික්‍රමයන් වෙත නැඹුරුවෙමින් සිටින්නී ය. අන් සියල්ලටමත් වඩා මෙය මෙහෙයවෙනු ඇත්තේ කම්කරු පන්තියට විරුද්ධව ය.

© www.wsws.org